<u>ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම -උපදෙස්</u>

<u>අයදුම්පත්‍රය සමග අදාල පරිදි පහත කොරතුරු ලබා දෙන්න</u>

1. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය
2. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්
3. ව්‍යාපාරික ස්ථානයේ හිමිකාරිත්වය තහවුරු කරන ලියවිලි (ඔප්පු පිටපත / බදු ඔප්පුව /බදු ගිවිසුම/කුලී ගිවිසුම යන්නෙහි සහතික කරන ලද පිටපත් (ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ)
4. ව්‍යාපාරය පිහිටි භූමිය /ගොඩනැගිල්ල අයිතිකරුගේ කැමැත්ත මත පමණක් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථානයක් නම් ඔහුගේ /ඇයගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීම
5. අදාල වර්ෂය සඳහා වරිපනම් ගෙවීමේ බිල් පතෙහි පිටපත
6. වෙළඳ බලපත්‍රයේ පිටපතක් (ව්‍යාපාර බදු) - අදාල නගර සභාව /ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන
7. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථිර පදිංචි අයකු නොවේ නම් ග්‍රාම නිලධාරී නිකුත් කරනු ලබන පදිංචි සහතිකය (DS 4)
8. ව්‍යාපාරය පවත්වාගෙන යන බව සනාථ කිරීමට අදාල වූ ලිඛිත සාක්ෂි හා ව්‍යාපාරයට අදාලව සම්පූර්ණ කර ඇති පුහුණු පාඨමාලාවන්හි නිකුත් කල සහතික වල පිටපත්
9. ඊ වෙළඳ සැලක් නම් වන සංරක්ෂණ සහතිකය
10. මුද්‍රණාලයක් නම් අධිකරණයෙන් ලබාගත් ප්‍රකාශයක්/මුද්‍රණාල දෙපාර්තුමේන්තුව හෝ ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තුමේන්තු සහතිකය
11. පරිසර වාර්තා (ගරාජ්, සර්විස් සෙන්ටර්, කර්මාන්ත, ඇළමිනියම්, තීන්ත සෑදීම, බ්ලොක් ගල් ආදිය)
12. ප්‍රවාහන සේවා නම් අයිතිකරුගේ නමට වාහන දෙකක්වත් තිබිය යුතුය.
13. ෆාමසි සඳහා ඖෂධ වේදී සහතිකය
14. භාණ්ඩ කුලියට දීම සඳහා (හට්, පුටු, මැෂින් ආදිය) භාණ්ඩ ලැයිස්තුව ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීම
15. ස්වර්ණාභරණ නිපදවන ස්ථාන හා මැණික් ව්‍යාපාරික ස්ථාන ලියාපදිංචි කිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය
16. ආයුර්වේද ඖෂධ මධ්‍යස්ථාන ලියාපදිංචිය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමැතිය